# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 48 — 1973 පෙබරවාරි 23 වැනි සිකුරාදා — 1973.02.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 259 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | 271 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් ... ... | 269 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 269 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| කොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම... ... | 270 | විවිධ දැන්වීම් ... ... ... | — |


සැලකිය යුතුයි.—ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාරය පනත් කෙටුම්පත සහ මුදල් හා ලංකා රජයේ උකස් බැංකු (සංශෝධන) පනත් කෙටුම්පත 1973 පෙබරවාරි 09 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේක වශයෙන් පළ කරන ලදී.

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**වරාය කොමිෂන් සභාවේ සේවක මහතුන්ට ආහාර සැපයීම**

වරාය කොමිෂන් සභාවේ සේවක මහතුන්ට ආහාර සැපයීම සඳහා ටැන්ඩර් මෙයින් කැඳවනු ලැබේ.

2. දිනකට දහවල් ආහාරය සඳහා පාර්සල් කරන ලද කෑම පැකට් 500 ක් පමණද, සෙනසුරාදා දිනවල කෑම පැකට් 200 ක් පමණද, පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව සැපයීමට ටෙන්ඩර් කරුවන් එකඟ විය යුතුය.

3. කෑම පාර්සලයකට :—

සම්බා බත් අවුන්ස 12 ක්
අවුන්ස 4 බැගින් ව්‍යංජන 2 ක්
අවුන්ස 1 1/2 ක මාලුකරි 1 ක්
බැදපු හෝ තම්බාපු බිත්තරයක් හෝ
අවුන්ස 2 ක බැදපු මාළු කෑල්ලක්
විශේෂ දෙයක්
අවුන්ස 1/2 ක සම්බලයක් හෝ
මිරිස් සමග බැදපු කරවල හෝ
තෙල් දමන ලද කරවල
අඩංගු විය යුතුය.

කෑම පාර්සලය ඔතන කඩදාසි ආදියෙහි බර අවුන්ස 2 කට වැඩි නොවිය යුතුය.

4. පසු දිනට අවශ්‍ය කෑම පාර්සල් ප්‍රමාණය ඊට කලින් දින සවස 3.00 ට පමණ තෝරාගත් ටෙන්ඩර් කරුවන්ට දන්වනු ලැබේ. දහවල් ආහාරවේල සඳහා කෑම පාර්සල් පෙරවරු 10.00 ට පමණ නියම කරනු ලබන ස්ථානයට ගෙනැවිත් භාරදිය යුතුයි.

5. කෑම වේලකට ගෙවනු ලබන්නේ රුපියලකි. ආහාරවේල් ගණන කලින් කලට වෙනස් විය හැකි අතර ඇණවුම් කරන ලද මුළු ආහාරවේල් ගණන වෙනුවෙන් මාස්පතා ගෙවීම කරනු ලැබේ.

6. රසවත්ව, පිරිසිදුව සහ ඉහත සඳහන් කොන්දේසිවලට අනුව කෑම තිබිය යුතුය. එසේ නොමැතිවූ විටදී කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබේ.

7. ඉහත සඳහන් කොන්දේසිවලට එකඟව කෑම සැපයීමට කැමති ටෙන්ඩර් කරුවන්ගේ මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1973 මාර්තු මස 07 වැනි දින දහවල් 12.00 ට පෙර ලේඛනගත තැපෑලෙන් වරාය කොමසාරිස් වෙත එවිය යුතුය. එසේ නැතහොත් දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් පෙට්ටියේ දැමිය යුතුය. කවරයේ වම් කෙළවරේ "වරාය කොමිසමේ සේවක මහතුන්ගේ ආහාර වේල" යන්න සඳහන් කළ යුතුය.

වී. සී. ප්‍රනාන්දු,
පාලක ලේකම්,
වරාය කොමසාරිස් වෙනුවට.

වරාය කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ, 1973 පෙබරවාරි මස 8 දින.

2–830—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

**සැලකිය යුතුයි**

**ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදවල පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමක හෝ හේතුවක් නිසාවත් භාරගනු නොලැබේ.**

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

**1972 දෙසැම්බර් මස 15 වැනි දින,**
**ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**කොළඹ.**

### කොළඹ වරාය කොමිෂන් සභාව

**චීන වරායේ "බර්මා කැම්ප්" හි පිහිටි වරාය කොමිෂන් සභා වැඩපලේ ආපන ශාලාව**

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද් දෙක කාලසීමාවකට යථෝක්ත ආපන ශාලාව බද්දීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1973. 03. 09 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම ෆෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1973. 03. 07 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් ෆෝර්ම සමග නිකුත් කරනු ඇත.

2–907—73.02.23 දින අංක 48 දරන ගැසට් පත්‍රය

---

### සුරාබදු දෙපාර්තමේන්තුව

**(ලංකාව) ශ්‍රී ලංකා, කොළඹ 1, සුරාබදු දෙපාර්තමේන්තුවට පානීය පරිපාක ස්ප්‍රිතු ගැලුම් 550,000 ක් සැපයීම සඳහාවූ ටැන්ඩරය**

පානීය පරිපාක ස්ප්‍රිතු ඉම්පීරියල් ගැලුම් 550,000ක් සැපයීම සඳහා ශ්‍රී ලංකා, කොළඹ 1, තැ. පෙ. 500, මුදල් අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 මැයි මස 24 වන දින පෙරවරු 10 දක්වා ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කොළඹ 1, ජේ මාස් ගොඩනැගිල්ලේ 1 වැනි මාලයේ පිහිටි සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැකි නියමිත ෆෝර්ම යන්හි ටැන්ඩර් ඉදිරිපත් කළ යුතු අතර ඒ පිළිබඳ සියළුම තොරතුරුද එම කාර්යාලයෙන් ලබාගත හැකිය.

3. කච්චේරියක හෝ කොළඹ 1, ජේ මාස් ගොඩනැගිල්ලේ පළමු වැනි මාලයේ සුරාබදු කොමසාරිස් කාර්යාලයේ හෝ රු. 100 තැන්පත් මුදලක් තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීම පිට 1973 මැයි මස 23 වන දින දහවල් 12 දක්වා ටැන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ජේ. ඩ. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

සුරාබදු කොමසාරිස් කාර්යාලය,
1 වන මාලය, ජේ මාස් ගොඩනැගිල්ල,
කොළඹ 1, 1973.02.01 වන දින.

2–816—73.02.23 දින අංක 48 දරන ගැසට් පත්‍රය

---

### තේ පාලක දෙපාර්තමේන්තුව

**පාවිච්චි කළ ලෑන්ඩ් රෝවර් රථයක් විකිණීම**

පාවිච්චි කරන ලද ලෑන්ඩ් රෝවර් රථයක් මිළදී ඉවත් කරගෙන යෑම සඳහා 1973 මාර්තු 12 වැනි සඳුද පස්වරු 2 දක්වා මවිසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර හා අදාල කොන්දේසි මෙම දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැකිය.

සී. චංමුගම්,
තේ පාලක.

තේ පලාන දෙපාර්තමේන්තුව,
කලම්බු පෝට් ලෑන්ඩ් බිල්ඩින්,
තැ. පෙ. 363, කොළඹ 1,
1973 පෙබරවාරි 12.

2–839—73.02.23 දින අංක 48 දරන ගැසට් පත්‍රය

---

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා මිළ ගණන් කැඳවීම**

පහත සඳහන් ද්‍රව්‍යයන් සැපයීම සඳහා 1973 මාර්තු මස 16 දින ප. ව. 2 දක්වා පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

(1) හොඳින් පුළුස්සන ලද මධ්‍යම ප්‍රමාණයේ හොඳ වර්ගයේ ගඩොල් 1,000 බැගින්.

(2) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ ගංගා වැලි කියුබ් එක බැගින්.

(3) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ ¾" සහ 1½" කැටගල් කියුබ් එක බැගින්.

(4) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ තම්බන ලද හුනු බුසල බැගින්.

(5) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ අළුහුණු බුසල් එක බැගින්.

මෙම ද්‍රව්‍යයන් පහත සඳහන් ස්ථානවලට ගෙනැවිත් භාර දිය යුතු සහ රජයේ වාහනවලට පටවා දිය යුතු රේට් ගණන වෙන වෙනම සඳහන් කළ යුතුය.

| | |
|---|---|
| පේරාදෙණිය ... | ... ගොඩනැගිලි වැඩබිම |
| වරකාපොල ... | ... ගොඩනැගිලි වැඩබිම |
| මීගමුව ... | ... ගොඩනැගිලි වැඩබිම |
| කැකිරාව ... | ... ගොඩනැගිලි වැඩබිම |
| රිකිල්ලගස් කඩ | ... ගොඩනැගිලි වැඩබිම |
| සීතා එළිය ... | ... ගොඩනැගිලි වැඩබිම |
| හිඟුරක් ගොඩ | ... ගොඩනැගිලි වැඩබිම |
| කන්දකඩුව ... | ... ගොඩනැගිලි වැඩබිම |
| පොළොන්නරුව | ... ගොඩනැගිලි වැඩබිම |
| අනුරාධපුර ... | ... ගොඩනැගිලි වැඩබිම |

2. මෙම සියළුම ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182 හි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමතකරන ලද නියම තත්ත්වයක් අනුව තිබිය යුතුය.

3. මෙම එක් ද්‍රව්‍යයකට හෝ සෑම ද්‍රව්‍යයකට ටෙන්ඩර් ඉල්ලුම් කළ හැකිය.

4. එක් එක් ගොඩනැගිලි වැඩබිම සඳහා වෙන වෙනම ටෙන්ඩර් ආකෘති පිටපත් දෙකකින් යුතුව පිළියෙල කොට ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ "ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා මිළ ගණන්" යන්න සඳහන් කොට සියළුම ටෙන්ඩර් අත්සන් තබා සීල් කර සුරක්ෂිතව ලේඛනගත තැපෑලෙන් 1973 මාර්තු මස 15 වෙනි දින පස්වරු 2 ට පෙර "සභාපති", ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය, සිවිල් ඉංජිනේරු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය, යන ලිපිනයට එවිය යුතුය.

5. සියළුම ටෙන්ඩර්පත්, ටෙන්ඩර් අනුමත කරන ලද දිනයේ සිට දින 40 ක කාලයක් භාර ගැනීම සඳහා වලංගුව තිබිය යුතුය.

6. ටෙන්ඩර් සියල්ල හෝ කොටසක් හෝ එකක් හෝ භාර ගැනීමට ප්‍රතික්ෂේප කිරීමට සම්පූර්ණ බලය රජය සතුය.

7. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පේරාදෙණියේ, කෘෂිකර්ම ඉංජිනේරු (ගොඩනැගිලි) තැනගෙන් අසා දැනගත හැක.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 පෙබරවාරි මස 7 වැනි දින,
පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
සිවිල් ඉංජිනේරු අංශයේ දී ය.

2–808—73.02.23 දින අංක 48 දරන ගැසට් පත්‍රය

13. පත්තර යනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින්, මෙම කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩ කරවා ගැනීමට, පුහුණු හා නුපුහුණු හා දෙවගීයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර, ඔවුහු පමණක් එසේ නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකිතරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටිනා අය අතුරිනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම්කිසි විදියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩු දෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එලැඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වරයාගේ එකඟත්වය ඇතිව, නිශ්චිතව ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකි. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම, තහනම් වන අතර, එය කොන්ත්‍රාත්තුව කඩකිරීමක් ලෙස සලකනු ලැබේ.

මෙම කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියකු අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූද, කම්කරුවනට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූල වූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කළාසේ සලකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපනතේ (117 වන අධිකාරිය) යටතේ සේවයෙහි යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දැක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේ ය.

17. වැඩ භාර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මඟින් තබා ඇති ලේඛණයේ තනි තනිව හෝ ලේඛණයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමඟ හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමඟ හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂ වරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

හේ. යූ. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ගොවිපල්).

1973 ජනවාරි මස 31 වන දින,
පේරාදෙණියේ දී ය.

2-815—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වතුර පොම්ප සැපයීම සඳහා ටෙන්ඩර්

පහත සඳහන් සැපයීම් සඳහා ටෙන්ඩර් පත් 73.03.22 වෙනි දින ප. ව. 1.30 තෙක් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ:—

| ටෙන්ඩර් අංකය | | සැපයීම් විස්තර | | | අවශ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| එම්.ටී/3/727303 | (අ) | අඟල් 2 | වතුර පොම්ප | — | 100 |
| ,, | (ආ) | අඟල් 3 | ,, | — | 25 |
| ,, | (ඇ) | අඟල් 4 | ,, | — | 15 |
| ,, | (ඈ) | අඟල් 6 | ,, | — | 10 |

2. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (ඉංජිනේරු අංශයේ) නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

3. අපේක්ෂිත ටෙන්ඩර් කරුවන්ට ඉහත 1 වෙනි ඡේදයෙන් සඳහන් සියල්ලටම හෝ ඉන් කොටසකට ටෙන්ඩර් කළ හැකිය.

4 ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, එම පිටපත් නිසියාකාර සම්පූර්ණ කර අත්සන් තබා සීල් තැබූ කවරයක බහා එහි වම් උඩ කෙළවරේ "" වතුර පොම්ප" සඳහා ටෙන්ඩර් අංක එම්ටී/3/727303 භාර ගැනීමේ අවසාන දින 73.03.23 ප. ව. 1.30" යන්න සඳහන් කොට පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාවෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

5. 73.03.19 වෙනි දින ඇතුළුව එතෙක් පමණක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. මීට පසු ටෙන්ඩර් පත් නිකුත් කරනු නොලැබේ.

6. ටෙන්ඩර් පත් නිකුත් කරනු ලබන්නේ ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250 පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝර්ක් වීදි ශාඛාවේ ලංකා බැංකුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ අංක 37 ගිණුමේ අයට මුදල් තැන්පත් කිරීමෙන් හෝ ඉදිරිපත් කරනු ලබන කුවිතාන්සියක් මත පමණයි.

7. කිසිම වග විභාගයක් නොමැතිව එවන ලද ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම හෝ එම ටෙන්ඩර් පතකින් කොටසක් හෝ සම්පූර්ණ එකම භාරගැනීමේ හිමිකම රජය සතු වේ.

8. වැඩිමනත් විස්තර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැකියි.

එල්. ආර්. එල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජනවාරි මස 30 වැනි දින,
පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේ දීය.

2-831/1—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ලී සකස් කරන යන්ත්‍රයක් සඳහා මිළ ගණන් කැඳවීම

පහත සඳහන් විස්තර වලට අනුකූලව ලී සකස් කරන යන්ත්‍රයක් සැපයීම සඳහා මිළ ගණන් පත් 73.03.16 වෙනි දින පෙ.ව. 10.30 තෙක් පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (ඉංජිනේරු අංශයේ) ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

**අවශ්‍ය ලී සකස් කරන යන්ත්‍රයේ විස්තර:**

විදුලියෙන් ක්‍රියා කරන ලී සකස් කිරීමේ යන්ත්‍රයකි. (වැඩි විස්තර සඳහා මෙහි ඉංග්‍රීසි අනුවාදය බලන්න).

2 මිළ ගණන් සීල් තැබූ කවරයක බහා එහි වම්පස උඩ කෙළවරේ "ලී සකස් කරන යන්ත්‍රයක් සැපයීම සඳහා මිළ ගණන්, එල්කිව්/3/717219—භාරගැනීමේ අවසාන දිනය 73.03.16 වෙනි දින පෙ. ව. 10.30" යන්න සඳහන් කොට පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලයේ (ඉංජිනේරු අංශය) සභාපති තුමා වෙත මිළ ගණන් වැසීමට නියමිත වේලාවට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

3. මිළ ගණන් දැක්විය යුත්තේ—

(අ) ගබඩාවෙන් වහාම නිකුත් කළහැකි සේ හෝ නියමිත කාල සීමාවක් තුළ සැදු දියහැකි අයුරිනි.

4. මිළ ගණන් භාරගැනීමේ අවසාන දින සිට සති තුනක් දක්වා එම මිළ ගණන් වලංගුව තිබිය යුතුය.

5 කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා හෝ ඔහු විසින් බලය පැවරූ වෙනත් නිලධාරියෙකු විසින් එම මිළ ගණන් භාරගෙන ඇති බවට එකී සමාගමට හෝ පුද්ගලයාට දැනුම් දෙනු ලැබේ. එවිට එම සමාගම්

### ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, 200 කිරුළ පාරේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩය සඳහා 1973 මාර්තු මස 13 වෙනි දින පෙරවරු 10 වන තෙක් භාර සීල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු ලැබේ.

වැඩ විස්තරය.—හොරවපතාන ඩිපෝ භූමියේ කැලෑ එළිකොට පස් පුරවා පොළොව සමතලා කිරීම.

**කොන්ත්‍රාත්කරුවන්ගේ අවම ලියාපදිංචි සීමාව.—රු. 15,000.**

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍ර වල පිළියෙල කොට අනුපිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය සියලුම විස්තර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත යුතු අතර, අදාළ සැළසුම් ආදිය ඔහුගේ කාර්යාලයේ දී පරීක්ෂා කළ හැක. ලංගම, රජයේ දෙපාර්තමේන්තු වල හෝ පිළිගත් සංස්ථාවල සිවිල් ඉංජිනේරු වැඩ සඳහා ඉදිරියෙන් පෙන්වා ඇති හෝ ඊට අධිකව ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති .

අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 25 බැගින් ද ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝර්ම ගාස්තු වශයෙන් රු. 25 බැගින් ද ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත 1973 මාර්තු මස 12 වෙනි දින දහවල් 12 ට හෝ ඊට පෙර ගෙවා එම කුවිතාන්සිය මා වෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

තවද ටෙන්ඩර්කරුවන් සුදුසු දැයි පරීක්ෂා කිරීම සඳහා ඔවුන් ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතු වේ. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ප්‍ර.ගි.නි. තැන වෙත මුදලින් තැන්පත් කළ හැක්කේ එම සහතික පත් පිළිගනු ලැබුවේ නම් පමණි.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
**ලංකා ගමනා ගමන මණ්ඩලය.**

අංක 200, කිරුළ පාර, කොළඹ 5.

02–916—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ වරාය කොමිෂන් සභාව

ඩොක් වේදිකාවේ උතුරින් පිහිටි ආපන ශාලාව.

**වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක** කාලසීමාවකට යථෝක්ත ආපන ශාලාව බදු දීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1973. 03. 09 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම පෝර්ම ලබා ගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුවය

3. 1973. 03. 07 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පෝර්ම සමග නිකුත් කරනු ඇත.

02–933—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ, මහ ලේකම් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සහ පාට ගෑම

කොළඹ 7 බෞද්ධාලෝක මාවතේ, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ, මහ ලේකම් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සහ පාට ගෑම සඳහා මිළ ගණන් 1973 මාර්තු මස 26 වෙනි දින උදේ 10 තෙක් භාරගනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තුවක, මණ්ඩලයක හෝ සංස්ථාවක රු. 5,000 කට නො අඩු මුදලකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් මේ සඳහා ටෙන්ඩර් කිරීමට සුදුස්සන් වේ.

රු. 25 ක ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය කාර්යාල වේලාවන්හි දී ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත් ලබා ගත හැක.

වැඩි විස්තර සඳහා කොළඹ 7, 415 බෞද්ධාලෝක මාවතේ ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ, මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම්ගෙන් ලබාගත හැක.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

1973 පෙබරවාරි මස 12 වෙනි දින, කොළඹ 7.

02–911/3—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා ධීවර සංස්ථාව

පාවිච්චි කරන ලද මෝටර් රථ වාහන විකිණීමට ටෙන්ඩර් කැඳවීම

පහත සඳහන් පාවිච්චි කරන ලද මෝටර් රථ වාහන විකිණීම සඳහා සීල් තබන ලද ටෙන්ඩර් 1973. 02. 27 වැනි දින ප. ව. 2.30 දක්වා කැඳවනු ලැබේ.

මේ සඳහා ටෙන්ඩර් පත් 73. 02. 26 වැනි දින ප. ව. 2 තෙක් රු. 100 ක ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් ගෙවා ලබාගත හැක.

එම වාහන ශ්‍රී ලංකා ධීවර සංස්ථාවේ මත්තුමගල ප්‍රවාහන අංශයේ දී පරීක්ෂා කළ හැක. දුරකථන අංකය 0782—262.

වැඩි විස්තර පහත අත්සන් කරන අයගෙන් ලබාගත හැක.

ලොරි අංකය හා වර්ගය

1. 24 ශ්‍රී 937—ඉසුසු
2. 33 ශ්‍රී 726— පෝර්ඩ් වී 8
3. 33 ශ්‍රී 1023—පෝර්ඩ් වී 8
4. 33 ශ්‍රී 6032—වෙවලට් වයිකිං—50
5. සී ඇන් 3240—පෝර්ඩ් වී 8
6. 24 ශ්‍රී 6845—බෙන්ස් (ඩීසල්)
7. 33 ශ්‍රී 6624—ශීතකරණ ලොරියක චැසිය (ඉන්ටනැෂනල් හාවෙස්ටර්) එන්ජිම වී 8.

කළමනාකාර සැපයීම් සහ ගබඩා.

රොක්හවුස් පටුමග, කොළඹ 15.
73.02.12.
දුරකථනය :22537.

02–912—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා ධීවර සංස්ථාව

පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා, කොළඹ 15, රොක්හවුස් පටුමග, ලංකා ධීවර සංස්ථා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973.02.28 දින ප. ව. 2.30 දක්වා සීල් තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

1. චීනච්චට්ටි (ගැලී) ලිප් තහඩු
2. චීනච්චට්ටි උඳුන් තහඩු
3. ශීතකරණ රාක්ක
4. කුට්ටි අයිස් බඳුන් (කැන්ස්).

ආපසු ලබාගත හැකි රු. 50 ක තැන්පත් මුදලක් ගෙවීමෙන් පහත අත්සන් කරන ලද අයගෙන් ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැක. ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලබන්නේ 73.02.27 දින දහවල් 12.00 වන තෙක් පමණි.

කළමනාකාර සැපයීම් සහ ගබඩා.

රොක්හවුස් පටුමග,
කොළඹ 15,
73.02.12.

02–913—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

වැටකේ, පැදුරු හා හණ කර්මාන්ත සඳහා අවශ්‍ය සායම් සැපයීම සඳහා ඒවා නිපදවන්නන් සහ ඔවුන්ගේ නියෝජිතයින් ගෙන් කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 5. 24 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් පත්‍රය සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු : 3/1—(4/25).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල. කොළඹ 1,
1973. 2. 12.

2–906—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

#### සේවයට නුසුදුසු මෝටර් වාහන විකිණීම

මරදානේ තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවේ ප්‍රවාහන අංශයට අයත් පහත සඳහන්, සේවයට නුසුදුසු මෝටර් වාහන විකිණීම සඳහා, කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ පස්වන මහලේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේ ගැනුම් පත් මණ්ඩල සභාපති විසින් 1973 මාර්තු මස 22 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| | |
|---|---|
| (1) 22 ශ්‍රී 2314 | (6) 22 ශ්‍රී 5190 |
| (2) 22 ශ්‍රී 2315 | (7) 22 ශ්‍රී 5191 |
| (3) 22 ශ්‍රී 2316 | (8) අයිසී 3434 |
| (4) 22 ශ්‍රී 5188 | (9) 4 ශ්‍රී 9253 |
| (5) 22 ශ්‍රී 5189 | |

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ පස් වන මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ෆෝර්ම වලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළයුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂාකර බැලීමටද, අවශ්‍ය විස්තර දැන ගැනීමටද පුළුවන. මරදානේ තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවේ, ප්‍රවාහන නිලධාරී තැන හමුවී වාහන පරීක්ෂා කර බැලීමට පිළිවෙල යොදා ගත හැකිය.

3. තැපැල් කාර්යාලයක හෝ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත හෝ ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් 50ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ප්‍රධාන විදුලි සංදේස ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1973 මාර්තු මස 19 වෙනි දින දවල් 12 වන තෙක් බලාපොරොත්තු ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබා ගත හැකිය.

එච්. සී. ඇස්. ඒ. ගුණවර්ධන,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

5 වන මහල,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
කොළඹ 1.

2–882/1—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

#### සේවයට නුසුදුසු බඩු විකිණීම

මරදානේ පිහිටි තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවේ තබා ඇති සේවයට නුසුදුසු බඩු බාහිරාදිය විකිණීම සඳහා, කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේ, ගැනුම්පත් මණ්ඩල සභාපති විසින් 1973 මාර්තු මස 23 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ 5 වෙනි මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ෆෝර්මවලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමට ද අවශ්‍ය විස්තර දැන ගැනීමට ද පුළුවන.

3. තැපැල් කාර්යාලයක හෝ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1973 මාර්තු මස 20 වෙනි දින දහවල් 12 වන තෙක් බලාපොරොත්තු ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගත හැකි වේ.

එච්. සී. එස්. ඒ. ගුණවර්ධන,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
තැ. පෙ. 503,
කොළඹ 1.

2–882/2—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

යාපනය දිස්ත්‍රික්කයේ, පහත සඳහන් වැඩ සඳහා යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති, මහා ලේකම් කාර්යාලය, යාපනය, විසින් 1973.04.06 දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ :—

| වැඩයේ ස්වභාවය | | ලියාපදිංචි විය යුතු මුදල රුපියල් |
|---|---|---|
| 1. යාපනය දිස්ත්‍රික්කයේ පච්චිලයිපල්ලි ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ ළිඳක් තැනීම | ... | 2,000 |
| 2. යාපනය දිස්ත්‍රික්කයේ තුනුක්කායි ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ පිහිටා ඇති වවුනිකුලම් VI වැනි කොට්ඨාශයේ ඉඩම් කට්ටි ඕවර්සියර් වරයාගේ නිවාසය අළුත්වැඩියා කිරීම | ... | 1,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙහි සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි මුදලකට මහා මාර්ග, වාරිමාර්ග හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිති වලට සහ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ටද 1973 අප්‍රියෙල් මස 04 වැනි දින පස්වරු 1.30 දක්වා යාපනය කච්චේරියේ ඉඩම් ශාඛාවේදී ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත. කොන්ත්‍රාත්තුව බලාපොරොත්තු වන අය තමන් එසේ ලියාපදිංචිවී ඇති බවට සාක්ෂි යාපනය දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

3. එක් එක් ටෙන්ඩර් වෙනුවෙන් රු. 25 ක තැන්පත් මුදලක් ගෙවූ බවට වූ කුවිතාන්සියක් ඉදිරිපත් කොට යාපනය දිසාපති ගෙන් ලබාගත හැකි ආකෘති වල දෙපිටපතකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල මේ දැන්වීම පළකරනු ලැබීමෙන් පසු තැන්පත් කළයුතු අතර, එම තැන්පත් තුවට සාක්ෂි වශයෙන් ලබාගන්නා ලද කුවිතාන්සිය ටෙන්ඩරයට ඇමිණිය යුතුය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පතුවෙනුත් ඇප තැන්පතු වෙනුත් නිදහස්ය. එසේ වුවද, ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබෙන්නේ ඉහත සඳහන් ලියාපදිංචිය ඉදිරිපත් කළ විට පමණි.

4. ටෙන්ඩර් පත් යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩරය ආවරණය කරන කවරය මුද්‍රා තැබිය යුතු අතර, එහි වම් පස උඩ කෙළවරේ වැඩයේ නම සඳහන් කළ යුතුය. ටෙන්ඩරය ලියාපදිංචි තැපෑලෙන් නොඑවනු ලැබේ නම් එය යාපනය මහා ලේකම් කාර්යාලයේ කාර්යාල සහකාරගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව නියමිත දිනයට පෙර පැමිණ තැන්පත් කළ හැකිය.

5. පළමුවෙනි ඡේදයේ දැක්වෙන වේලාවට පසු ලැබෙන ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

6. ටෙන්ඩර් භාර ගැනීම අවසානවූ විට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩ විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන් පැමිණ සිටිය යුතුය.

7. ටෙන්ඩරය බාරගත් නා ලද බව ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබ දින 10 ක් ඇතුළත යම් කෙනෙකු ගිවිසුමට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළොත් හෝ අත්සන් කිරීමට අසමත් වුවහොත් එසේ නැතහොත් අනුමත කරන ලද ඇප මුදල බැඳීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පතුව රාජසන්තක කරනු ලැබේ.

8. පිළිගනු ලැබූ කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවීමේදී සේවයට ගත යුත්තේ පුහුණු හා නුපුහුණු ලාංකික කම්කරුවන් පමණක් වන අතර, හැකිතාක් දුරට එම කම්කරුවන් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම බඳවා ගත යුතුය.

9. පිළිගනු ලැබූ ටෙන්ඩර් කරුට ගිවිසුමක් අත්සන් කිරීමටත්, ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 5 ක් ඇප වශයෙන් යාපනය දිසාපති වෙත තැන්පත් කිරීමටත්, එම ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත වැඩ අවසන් කර බාරදීමටත් නියම වනු ඇත.

10. වැඩ පිළිබඳ වෙනත් අවශ්‍ය විස්තර ඇතොත් යාපනය දිසාපති ගෙන් ලබා ගත හැකිය.

11. පැහැර හැරී කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවේ නම් සඳහන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

12. ප්‍රශ්නයෙන් තොරව, කිසියම් ටෙන්ඩරයක් හෝ සියලු ටෙන්ඩර හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ භාර ගැනීමේ අයිතිය දිසාපති තබා ගනී.

13. ටෙන්ඩර්කරුවන් තමන් ඉදිරිපත් කරන ගණන්, ටෙන්ඩර් විවෘත කරනු ලබන දිනයේ සිට මාසයක් විවෘතව තැබිය යුතුය.

ඊ. මුරුගේසපිල්ලෙයි,
උප දිසාපති,
යාපනය දිසාපති වෙනුවට.

1973 පෙබරවාරි මස 13 වෙනි දින,
ඉඩම් ශාඛාව, කච්චේරිය,
යාපනය.

2–932/1—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

යාපනය දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973.04.06 වෙනි දින පස්වරු 1 දක්වා කොළඹ තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ :—

| වැඩයේ ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල රුපියල් |
|---|---|
| 1. යාපනය දිස්ත්‍රික්කයේ කරාච්චි ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ පිහිටා ඇති අඩම්පන් ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයේ ප්‍රවේශ පාර තැනීම ... | 23,000 |
| 2. යාපනය දිස්ත්‍රික්කයේ ඩෙල්ෆ්ට් ප්‍රා.ආ.නි. කොට්ඨාශයේ පිහිටා ඇති කලාවරයි ගම් පුළුල් කිරීමේ ව්‍යාපාරයේ ඇතුළත පාර තැනීම ... | 21,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙහි සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි මුදල් මහ මාර්ග, වාරිමාර්ග හෝ අධ්‍යාපන යන දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට සහ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ටද 1973 අප්‍රියෙල් මස 02 වැනි දින පස්වරු 1.30 දක්වා යාපනය කච්චේරියේ ඉඩම් ශාඛාවේ දී ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත. කොන්ත්‍රාත්තුව බලාපොරොත්තු වන අය තමන් එසේ ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි යාපනය දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩරය වෙනුවෙන් රු. 25 ක තැන්පත් මුදලක් ගෙවූ බවට වූ කුවිතාන්සියක් ඉදිරිපත් කොට යාපනය දිසාපතිගෙන් ලබාගත හැකි ආකෘතිවල දෙපිටපතකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල මේ දැන්වීම පළ කරනු ලැබීමෙන් පසු තැන්පත් කළයුතු අතර, එම තැන්පතුවට සාක්ෂි වශයෙන් ලබා ගන්නා ලද කුවිතාන්සිය ටෙන්ඩරයට ඇමිණිය යුතුය. අනුමත සමිති ටෙන්ඩර් තැන්පතුවෙනුත් ඇප තැන්පතුවෙනුත් නිදහස්ය. එසේ වුවද, ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ ඉහත සඳහන් ලියාපදිංචිය ඉදිරිපත් කළ විට පමණි.

4. ටෙන්ඩර්පත පිටපත් දෙකකින් යුතුව කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතුය. ටෙන්ඩරය ආවරණය කරන කවරය මුද්‍රා තැබිය යුතු අතර, එහි වම්පස උඩ කෙළවරේ වැඩයේ නම සඳහන් කළ යුතුය. ටෙන්ඩරය ලියාපදිංචි තැපෑලෙන් නොඑවනු ලැබේ නම් එය ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ අංක. 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව නියමිත දිනට පෙර පැමිණ තැන්පත් කළ හැකිය.

5. පළමුවෙනි ඡේදයේ දක්වෙන වේලාවට පසු ලැබෙන ටෙන්ඩර් භාර ගනු නොලැබේ.

6. 1973.04.06 වෙනි දින පස්වරු 2 ට ඉහතකී අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

7. ටෙන්ඩරය බාරගන්නා ලද බව ලියවිල්ලකින් දැනුම් දෙනු ලැබ දින 10 ක් ඇතුළත යම් කෙනෙකු ගිවිසුමට අත්සන් කිරීම ප්‍රතික්ෂේප කළොත් හෝ අත්සන් කිරීමට අසමත් වුවහොත් එසේ නැතහොත් අනුමත කරන ලද ඇප මුදල බැඳීමට අසමත් වුවහොත් ටෙන්ඩර් තැන්පතුව රාජසන්තක කරනු ලැබේ.

8. පිළිගනු ලැබූ කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවීමේ දී සේවයට ගතයුත්තේ පුහුණු හා නුපුහුණු ලාංකික කම්කරුවන් පමණක් වන අතර, හැකිතාක් දුරට එම කම්කරුවන් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම බඳවා ගත යුතුය.

9. පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුට ගිවිසුමක් අත්සන් කිරීමටත් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 5 ක් ඇප වශයෙන් යාපනය දිසාපති වෙත තැන්පත් කිරීමටත්, එම ගිවිසුම අත්සන් කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත වැඩය අවසන් කර බාරදීමටත් නියම වනු ඇත.

10. වැඩ පිළිබඳ අවශ්‍ය වෙනත් විස්තර ඇතොත් යාපනය දිසාපතිගෙන් ලබාගත හැකිය.

ඊ. මුරුගේසුපිල්ලෙයි,
උප දිසාපති,
යාපනය දිසාපති වෙනුවට.

1973 පෙබරවාරි 13 වෙනි දින,
යාපනය කච්චේරියේ,
ඉඩම් ශාඛාවේ දී ය.

2–932/2—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

වාත්තු අඟුරු සැපයීම සඳහා ටෙන්ඩරය

1973 මාර්තු මස 30 දින පෙරවරු 10 දක්වා වාත්තු අඟුරු ටොන් 750ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ. රු. 100 ක ආපසු ලබා ගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවීමෙන් අවශ්‍ය ටෙන්ඩර් පෝරම කොළ මෙම කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩරය අවසාන වන දිනට පෙර දින දහවල් 12 ත් පසු භාර ගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පත් රු. 5 ක් ගෙවීමෙන් ලබා ගත හැක.

මිලට ගැනුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහභාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 670, 242, හැව්ලොක් පාර, කොළඹ 5.

2–914—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම්

අංකය : කිව්.බී. 80/72.

**පොලිස් දෙපාර්තමේන්තුව—ටෙන්ඩර් තීරණ**

කොකු ගුදිරි 2,000 ක් සැපයීම—ටෙන්ඩර් භාරගැනීම අවසන් වූ දිනය 1972.12.22

1972.12.1 දින නිකුත් වූ රජයේ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශ කරන ලද ඉහත සඳහන් සැපයීම පිළිබඳ ටෙන්ඩරය සම්බන්ධයෙන්, ටෙන්ඩර්කරුවන් 9 දෙනෙකු විසින් මිල ගණන් 12 ක් ඉදිරිපත් කරන ලදී. තෝරාගත් ටෙන්ඩර්කරු පිළිබඳ විස්තර පහත දැක්වේ.

නයනා ෆිපර්නිෂිං හවුස්,
55, ඇවොන්ඩේල් ඇවනියු, කොළඹ 10.

භාරගත් මිලගණන් : එක් කොකු ගුදිරියකට රු. 28.00.

ජී. සුංචිමගත් මයා,
පොලිස්පති වෙනුවට.

පොලිස් මූලස්ථානය,
කොළඹ 1,
1973 පෙබරවාරි මස 10 වැනි දින.

2-926—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

# බඩුබාහිරාදිය විකිණීම්

**රේගුවේ වෙන්දේසියක්**

කොළඹ, රේගුවේ කොටුවේ ගුදම්වල තැන්පත් පහත සඳහන් බඩු 1973 මාර්තු මස 6 වෙනි දින පෙරවරු 9.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 මාර්තු මස 5 වෙනි දින එම බඩු ගැණුම්කරුවනට පරීක්ෂා කර බැලීමට පිළිවන.

ඉල්ලීම අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් මිලයට ගත්තා භාණ්ඩයෙහි වටිනාකමින් 50% ක මුදලක් තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසියෙන් මිලයට ගත් බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත්, එම බඩු නැවත විකුණන බවත්, ඒසඳහා ගෙවාඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

වෙන්දේසිය පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වැනි දින ගැසට් පත්‍රය බලන්න.

ටී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒ ඩී/විකිණීම්/92
1973 පෙබරවාරි මස 13 වන දින,
කොළඹ රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

(1) කෘතිම රෙසින් පලුදුවූ මලු 66 යි
(2) සුදු කුඩු (සිල්ටොන්) පලුදුවූ මලු 6 යි
(3) බෙයර් 'ටී' (රසායන ද්‍රව්‍ය) කඩදාසි මලු 1 යි
(4) රෙඩ් ඔක්සයිඩ් පලුදුවූ මලු 10 යි
(5) හිස් පීප්ප 1 යි
(6) හිස් පීප්ප 1 යි
(7) රසායන ද්‍රව්‍ය කඩදාසි මලු 2 යි
(8) රසායන ද්‍රව්‍ය පලුදුවූ මලු 3 යි
(9) රසායන ද්‍රව්‍ය කඩදාසි මලු 1 යි
(10) රසායන ද්‍රව්‍ය මලු 1 යි
(11) වොට්ල් එක්ස්ට්‍රැක්ට් මලු 10 යි
(12) "වුඩින්" ෂූ ෂැන්ක්ස් තොග 1 යි
(13) ෆෑන් බෙල්ට් මිටි 1 යි
(14) වානේ කම්බි රෝල් 1 යි
(15) යකඩ සහ වානේ ඇණ මුරිච්චි සහ වොෂර් තොග 1 යි
(16) හිස් ප්ලාස්ටික් පීප්ප 2 යි
(17) මැච් පේපර් රීල් 12 යි
(18) රසායන ද්‍රව්‍ය මලු 10 යි
(19) කපු නූල් මලු 1 යි
(20) නයිලෝන් නූල් කාටූන් 1 යි
(21) කාබන් බ්ලැක් පලුදුවූ මලු 7 යි
(22) කාබන් බ්ලැක් පලුදුවූ මලු 10 යි
(23) කාබන් බ්ලැක් පලුදුවූ මලු 2 යි
(24) යකඩ පයිප්ප 300 ක් පමණ
(25) මිශ්‍ර බඩු මලු 2 යි
(26) වීදුරු ලාම්පු කාටූන් 2 යි
(27) කිරි ආහාර පෙට්ටි 1 යි
(28) බෙහෙත් ද්‍රව්‍ය පෙට්ටි 1 යි
(29) මුද්‍රිත පත්‍රිකා පෙට්ටි 1 යි
(30) ප්ලෝරන්ස් විශුබ් කාටූන් 2 යි
(31) විදුලි භාන්ඩ කාටූන් 1 යි
(32) කිරි ආහාර කාටූන් 1 යි
(33) පොත් කාටූන් 2 යි

2-934—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය.

---

**ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය**

**වෙන්දේසියේ විකිණීමයි**

1973 අප්‍රේල් 5 වෙනි දින උදේ 8 ට වැලවේ ව්‍යාපාරයේ සේවයට ගත නොහැකි විදුලි නිපදවන යන්ත්‍ර සහ කොන්ක්‍රීට් මිශ්‍රක, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙයට අයිති බඩු.—ෂටල් ඩම්පර්ස්, ට්‍රැක්ටර්, එයා කොම්ප්‍රෙරෙසර්, කොන්ක්‍රීට් මිශ්‍රක, බර ඉස්සුම් (ක්‍රේන්ස්), පාර තලන රෝල්, විදුලි ජෙනරේටිං, කොම්පැක්ටර්, ගල් කඩන යන්ත්‍ර, වතුර පොම්ප සහ විවිධ උපකරණ ද වේ.

වෙනදේසියේ දී ඉල් වූ ගණන් පිළිගත් වහාම මිළ දී ගත් සියළුම භාණ්ඩවලට මුදල් වලින් ගෙවීම කළයුතු අතර විකුණනු ලැබූදින සිට දින හතක් (7) තුළ එම භාණ්ඩ ඉවත් කර ගත යුතුයි.

වැඩිමනත් විස්තර සහ උපකරණ ලැයිස්තුව රුපියල් 2 ක මුදලක් ගෙවා කොළඹ 7, ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ අංක 415 බෞද්ධාලෝක මාවතේ මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම් ගෙන් ලබාගත හැක.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

1973. 2. 13.

2-911/1—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

**ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය**

**වෙන්දේසියේ විකිණීමයි**

1973 මාර්තු මස 22, 23 සහ 24 වෙනි දිනයන්හි උදේ 8 ට අම්පාරේ යාන්ත්‍රික වැඩ පලෙහි ඇති සේවයට ගත නොහැකි යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙයට අයිති බඩු නම්.—පොඩි සහ ලොකු වාහන, ට්‍රැක්ටර්, කැට පිලර් ට්‍රැක්ටර් සහ යන්ත්‍ර, පස් කපන යන්ත්‍ර, මෝටර් බෝට්ටු, කොන්ක්‍රීට් මිශ්‍රක, ඔස්ටින් ලොරි චැසි, මෝටර් බයිසිකල්, තණ කතුරු, වතුර පොම්ප, පර්කිං, ජනරල් මෝටර්ස්, ඉන්ටර්නැෂනල් ක්‍රිසල්ස්, විලීස් ජීප් රෝල්, ලෑන් රෝවර්, සහ ෆෝඩ් එන්ජින්ස්, කාර් සහ විවිධ උපකරණ ද වේ.

වෙන්දේසියේ දී ඉල් වූ මිල ගණන් පිළිගත් වහාම මිල දී ගත් සියළුම භාණ්ඩ වලට මුදල් වලින් ගෙවීම් කළ යුතු අතර, විකුණනු ලැබූ දින සිට දින හතක් (7) තුළ එම භාණ්ඩ ඉවත් කරගත යුතුයි.

වැඩි විස්තර සහ උපකරණ ලැයිස්තුව රු. 8 ක මුදලක් ගෙවා කොළඹ 7, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ අංක 415, බෞද්ධාලෝක මාවතේ මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම් ගෙන් ලබාගත හැක.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

1973. 2. 13 වන දින.

2-911/2—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### කොළඹ පැළ වෙළඳ සැලේ ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දෙපාර්තමේන්තුවේ කොළඹ 7, මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 12ඒ ස්ථානයේ පිහිටි, පැළ වෙළඳ සැලට අයත් පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ 1973 මාර්තු මස 09 වෙනි දින පෙ. ව. 10 ට ඉහත සඳහන් ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ කුවිණනු ලැබේ :—

| | | |
|---|---|---|
| (1) | හිස් ගෝනි | 88 |
| (2) | යකඩ සල්ලි පෙට්ටි | 01 |
| (3) | හිස් ලී පෙට්ටි 26×20×18 | 01 |
| (4) | සීනු ඔරලෝසු | 01 |
| (5) | දුම් විසිරන | 01 |
| (6) | රබර් මුද්‍රා | 08 |
| (7) | බාල්දි | 01 |
| (8) | විදුලි බල කෝතල | 01 |

2. වෙන්දේසි වූ මොහොතේම සම්පූර්ණ මුදල් ගෙවිය යුතු අතර, වෙන්දේසිය පැවැත්වෙන දින පස්වරු 4 ට පෙර සියලුම භාණ්ඩ ගැණුම්කරුවන් විසින් පැළ වෙළඳ සැලෙන් ඉවත් කර ගත යුතුවේ.

3. මෙම භාණ්ඩ වෙන්දේසිය පැවැත්වෙන දිනට පෙර දිනවලදී කාර්යාල වේලාවන් තුළදී පරීක්ෂා කර බැලිය හැකිය.

එස්. තවරාජවේල්,
කෘෂිකර්ම නිලධාරි (ගො.පා. හා නි.),
කොළඹ.

ගොවිපල් පාලන හා නිෂ්පාදන කාර්යාලය,
තැ. පෙ. 622, පළතුරු කම්හල පාර,
නාරාහේන්පිට, කොළඹ 5.
1973 පෙබරවාරි මස 07 වැනි දින,

2–799—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

## මහේස්ත්‍රාත් උසාවිය—මඩකලපුව

### බඩු බාහිරාදිය විකිණීම

පහත සඳහන් හිමිකරුවන් නොමැති රාජසන්තක කරන ලද භාණ්ඩ 1973 මාර්තු මස 10 වෙනි දින ප.ව. 3 ට මෙම උසාවියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

බඩු මිලයට ගන්නා අය වෙන්දේසිය අවසානයේදී එම බඩු වෙන්දේසි කරන ස්ථානයෙන් ඉවත් කර ගත යුතුය.

| නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|
| ඒ. 3125 | රැලේ බයිසිකල් එකක්, නො. සීපී. 1397 |
| — | රැලේ බයිසිකල් එකක්, නො. 22239 |
| — | රැලේ බයිසිකල් එකක්, නො. ඒ. 3040 |
| බී. 1455/ඒ. 2738 | සයිකල් ප්‍රේම් එකක්, නො. ඊජේ. 982 |
| 30532 | බී.එස්.ඒ. සයිකල් ප්‍රේම් එකක්, නො. සීපී. 368 |
| 30532 | රජ් බයිසිකල් ප්‍රේම් එකක්, නො. සීඩබ්ලිව්. 447 |
| ඒ. 2922/බී. 541 | රැලේ සයිකල් ප්‍රේම් එකක්, නො. ඊ.එස්. 283 |
| ඒ. 3231 | සයිකල් ප්‍රේම් එකක්, නො. ජී. 387111 |
| ඒ. 3081 | බොෂ් හෝන් එකක්, නො. එච්ඕ. 5 (ඒ) 7105250 |
| ඒ. 3144 | දිගහැරිය හැකි, නැමිය හැකි අහල් 2 ක් දිග පිහියා එකයි |
| ඒ. 3168 | දිග හැරිය හැකි, නැමිය හැකි අහල් 4 ක් දිග පිහියා එකයි |
| 37362 | වානේ ට්‍රන්ක් පෙට්ටි එකයි |
| 36186 | වානේ ට්‍රක්න් පෙට්ටි එකයි |
| — | වානේ ට්‍රන්ක් පෙට්ටි දෙකයි |
| ඒ. 3507 | fපයිබර් සූයිට් කේස් එකයි |
| — | fපයිබර් සූයිට් කේස් එකයි |
| 38562 | පැට්‍රෝල් මැක්ස් ලාම්පු එකයි |
| ඒ. 2923/බී. 1792 | ලොකු කුඩ එකයි |
| — | පොරව දෙකයි |
| — | මන්න සහ කැති 17 යි |
| ඒ. 3338 | එක්ස්හෝස්ට් එකයි |
| — | හුඩ් කැරියර් එකයි |
| — | ටයර් එකයි, 7.50—16 |
| 37180 | පාර්ගෝ මැන්ටල් එකයි |
| 38655 | පාර්ගෝ මැන්ටල් එකයි |
| 38796 | පාර්ගෝ මැන්ටල් දූසිම් දෙකක් සහිත පෙට්ටි එකයි |
| 38848 | මැන්ටල් 56 ක් සහිත පෙට්ටි එකයි |
| 38756 | රානි සඳුන් සබන් කැලි එකයි |
| 38757 | වික්ස් වේපරබ් බෝතල් එකයි |
| — | බුසල් එකක ප්‍රමාණයේ මැනීමෙ උපකරණ හතක් |
| — | ගෝනි කැලි මිටියක් |
| — | හිස් බෝතල් 152 ක් |
| — | වීදුරු 45 ක් |

කේ. සෝමසුන්දරම්,
ප්‍රාදේශීය උසාවි පාලන ලේකම්,
උසාවිය, මඩකලපුව.

1973 ජනවාරි මස 29 වැනි දින,
මහේස්ත්‍රාත් උසාවිය,
මඩකලපුව.

2–883—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

# තොවූපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## වවුනියා දිස්ත්‍රික්කයේ රා රේන්ද නැවත විකිණීම—1973

### මාර්තු මස 1 සිට 1973 සැප්තැම්බර් මස 30 දින දක්වා කාලය සඳහා

1973 මාර්තු මස 1 සිට 1973 සැප්තැම්බර් මස 30 දක්වා කාලය සඳහා වවුනියා දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමෙ අයිතිය පමණක් විකිණීම සඳහා (පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට) සුරාබදු බලපත්‍රයන්ට අදාළ කොන්දේසි මාලාවට යටත්ව 1972 ඔක්තෝබර් 31 වැනි දින ප්‍රකාශයට පත් අංක 31/3 අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව, ටෙන්ඩර් පත් මෙයින් කැඳවනු ලැබේ.

2. පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් කර ඇති වේලාවට කලින් වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත "1973 වර්ෂය සඳහා වවුනියාව දිස්ත්‍රික්කයේ රා රේන්ද මිලයට ගැනීමේ ටෙන්ඩරය" යි සඳහන් කර 1973 පෙබරවාරි 26 වැනි දිනට හෝ ඊට ප්‍රථම එවිය යුතුය.

3. එක් එක් තැබෑරුම් සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත්‍රය බැගින් එවිය යුතුයි. තවද, එක් අයෙකු විසින් එක තැබෑරුමක් සඳහා එක ටෙන්ඩරයකට වැඩි ගණනක් නොඑවිය යුතුය. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට නොවැඩි ගණනකට සාමූහිකව ටෙන්ඩරයක් එවිය හැකියි.

4. පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ :—

(අ) ටෙන්ඩර් පත්‍රය එවනු ලැබූ අය පුද්ගලිකව නොපැමිණිය හොත්;

(ආ) සෑම ටෙන්ඩර් පත්‍රයකටම ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිහිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදයම් නිලධාරියා විසින් නිකුත් කරන ලද වත්කම් සහතිකයේ මුල් පිටපත ද අමුණා තිබිය යුතු අතර, එක් තැබෑරුමකට වැඩියෙන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවල මෙහි පහත දක්වා ඇති පරිදි, මුල් පිටපත සහ එහි විධිමත් ලෙස සහතික කරන ලද පිටපතක් අමුණා තිබිය යුතුය. එවැනි වත්කම් සහතිකයක් අමුණා නොමැතිවූද, ටෙන්ඩරයේ දක්වෙන මුදල් ප්‍රමාණයෙන් සියේට 25 කට අඩු වටිනාකමක් ඇති වත්කම් සහතිකයක් අමුණා ඇත්තාවූ ද, ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකිය. තැබෑරුම් එකකට වැඩි ගණනකට ටෙන්ඩර් ඉදිරිපත් කරන ටෙන්ඩර්කරුවන් විසින් එම රේන්ද වර්ෂයේදීම අනික් එක් ටෙන්ඩරයක් සමඟ වත්කම් සහතිකයේ මුල් පිටපත් අමුණා යවා ඇත්නම් අනිකුත් ටෙන්ඩර්වලට එම සහතිකයේ සහතික පිටපත් අමුණා යැවිය හැකිය. එවැනි අවස්ථාවලදී මුල් වත්කම් සහතිකය අමුණා යැවූ ටෙන්ඩරයට අදාළ තැබෑරුමේ පිහිටීම නම සහ අංකය දක්වෙන සටහනක් අනික් ටෙන්ඩර් පත්‍ර සමඟ ඉදිරිපත් කරන සහතික පිටපත්වල තිබිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවීම හෝ වවුනියාව දිසාපති කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ දැමීම හෝ වවුනියාව දිසාපතිතුමාට හෝ එතුමාගේ කාර්යාල සහකාර තැනට හෝ පුද්ගලිකව භාරදිය හැකි නමුත්, ටෙන්ඩර් පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් කෙළවර ටෙන්ඩරය එවනු ලැබූ තැබෑරුමේ නම හා අංකය සඳහන් කර කවරය සීල් තබා එවිය යුතුය. එක් එක් ටෙන්ඩරය සම්බන්ධයෙන් එක් ලියුම් කවරය බැගින් පාවිච්චි කළයුතු අතර, එක් එක් ලියුම් කවරයේ ඉහතින් සඳහන් කර ඇති පරිදි තැබෑරුම් නම හා අංකය සඳහන් කළ යුතුය.

6. විකිණීමේ කොන්දේසි සපුරාලීම වශයෙන් සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමඟම රු. 1,000 කට කච්චේරි කුවිතාන්සියක් ඇමිණිය යුතුයි. සියළුම තැන්පත් කිරීම් වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති නමින් විය යුතුය. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමි වූ විගසම විකිණීමේ කොන්දේසිවලට අත්සන් තැබීමට ඉදිරිපත් නොවුවහොත් ඇප මුදල රාජසන්තක වේ.

7. ටෙන්ඩර් පත්‍ර ලබාගත් නමුත්, ටෙන්ඩර් ඉදිරිපත් නොකළ අය, ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ඉල්ලීමේදී මුලින් ලබාගත් ටෙන්ඩර් පත්‍ර ආපසු භාරදිය යුතුය.

8. ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ බලය වවුනියාව දිසාපතිතුමා සතුය.

9. සාර්ථක ලෙස ටෙන්ඩරය ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්කරු රාජේන්ද මිළට ගත් ලෙස ප්‍රකාශයට පත් කළ වහාම වවුනියාව දිසාපතිතුමා විසින් ඇප මුදල් වශයෙන් නියම කරනු ලබන මුදල වහාම දිසාපතිතුමා වෙත ගෙවිය යුතු අතර, ටෙන්ඩර්කරු විසින් අවශ්‍ය මුද්දර ඉදිරිපත් කර කොන්දේසි මාලාවකට හා වෙනත් කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතුය.

10. සාර්ථක ලෙස ටෙන්ඩර් කරන ලද අය ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම තමා විසින් තැබෑරුම් පවත්වාගෙන යාමට තෝරාගත් ස්ථානය දිසාපතිතුමාට දැන්විය යුතු අතර, ඒ සඳහා එතුමාගෙන් අනුමැතිය ලබාගත යුතුය.

11. පූර්වෝක්ත විකිණීම සම්බන්ධ කොන්දේසි හා වෙනත් විස්තර සඳහා වවුනියාව දිසාපති කාර්‍යාලයට ලියා විමසන්න.

උපලේඛනය

| අංකය හා ප්‍රදේශය | | තැබෑරුම පිහිටි පළාත් පාලන කොට්ඨාශය | | ටෙන්ඩරය භාරගන්නා අවසන් වේලාව |
|---|---|---|---|---|
| 2—වලයන්මඩම | ... | ගම් සීමාව තුල | ... | පෙ.ව. 10.00 ට |
| 6—අලම්විල් | ... | ගම් සීමාව තුල | ... | පෙ.ව. 10.15 ට |

එස්. සිවඥානම්,
වවුනියා දිසාපති වෙනුවට,
අතිරේක දිසාපති.

1973 පෙබරවාරි මස 09 වැනි දින,
වවුනියා දිසාපති කාර්‍යාලයේ දී ය.

2–796—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ නොවන දැන්වීම්

### නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙරාතුව කෙරෙන නීත්‍යානුගත දැන්වීමයි

මහනුවර දිසාවේ කටුගස්තොට කහල්ලේ පදිංචි කුඩාබණ්ඩා දගම්පත් වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුල්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපනතේ 107 වන පරිච්ඡේදයේ 7 වන වගන්තියේ පළමුවන උපලේඛනයේ "ආ" කොටසේ 2 වන නියෝගය ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

කේ. බී. දගම්පත්.

1973 ජනවාරි 31.

2–928—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අලුත් කුරු කෝරළේ 'බී' කොට්ඨාශයේ දාසිය පත්තුවේ ගල්ලේගෙදර (ලිපිනය :—ගම්පහ, කොළඹ පාර, අංක 105) නිවැසි දෙන් ගුණතිලක බියන්විල වන මම, කොළඹ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් වැඩ කරන නොතාරිස් කෙනෙකු ලෙස ඇතුලත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව, නොතාරිස් ආඥපනතේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඩී. ජී. බියන්විල.

1973. 2. 8.

2–856—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස්වරුන්ගේ අවසාන විභාගයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන ඉල්ලීමයි

නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැටේ පල්ලේ ගම්පහ කෝරලේ යටිවැල්ලේ පදිංචි කෝරාලලාගේ නොහොත් යටිවාවල වලව්වේ රණසූර සමරදිවාකර ඒකනායක විජයරත්න බණ්ඩාර වාසල මුදියන්සේ රාලහාමිල්ලාගේ ටිකිරි බණ්ඩා යටිවැල්ලේ වන මා, ප්‍රතිඥාත ලිපිකරු වශයෙන් දැමුරුදූ පුහුණුව අවසන්ව නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීමට රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාණෝ වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරන බව මෙයින් දැනුම් දෙමි.

ටී. බී. යටිවැල්ලේ.

1973. 2. 8.

2–918—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

හලාවත කොට්ඨාශයේ වට්ටක්කලියේ පදිංචි ආනන්ද ඇනස්ලි මදුරප්පෙරුම වන මම, නොතාරිස් අවසාන පරීක්ෂණයට රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දන්වමි.

ආනන්ද ඇනස්ලි මදුරප්පෙරුම.

වට්ටක් කුලිය,
හලාවත,
1973. 2. 1.

2–855—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙර කරන නීත්‍යානුකූල දැන්වීමයි

මාතර දිසාවේ තිහගොඩ නායිම්බල ගොඩවත්තේ පදිංචි රදම්පොල ගමගේ පියදාස වන මම, මෙදින සිට පුරා මසක් ගතවූ පසු මාතර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥපනතේ 107 වෙනි අධිකාරියේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ආර්. ජී. පියදාස.

1973. 2. 6.

2–857—73.02.23. දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට ප්‍රථම කෙරෙන නීත්‍යානුගත දැන්වීමයි

වලස්මුල්ලේ පදිංචි පෝද්දුව කංකානම්ගේ ජෝන් සිරිල් වන මම, හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු වශයෙන් ඇතුලත්වීම —පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට වර්ෂ 1907 අංක 1 දරණ නොතාරිස් ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දැනුම් දෙමි.

පී. කේ. ජේ. සිරිල්.

2–860—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

**නොතාරිස් කෙනෙකු මෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රයකි**

මග්ගොන මුණසිංහගොඩ පදිංචි තිවන්ක ජයසූරිය වන මම, අද දින සිට පූර්‍ණ මාසයක් ගතවූ පසු කොළඹ දිසාව තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු ලෙස ඇතුළත් කර ගන්නාමෙන් රෙස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තියේ පළමු උපලේඛනයේ "බී" කොටසේ 2 වන නියෝගයේ ප්‍රකාර ශ්‍රී ලංකා රජයට හා මහජනයාටද මෙයින් දැනුම් දෙමි.

තිවන්ක ජයසූරිය.

1973. 2. 10.
මුණසිංහගොඩ,
මග්ගොන.

2–875—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රයේ පදිංචි සුගතදාස වික්‍රමසිංහ වීරක්කොඩි අප්පුහාමි වන මම, මා පොළොන්නරු දිසාවේ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස් කෙනෙකු ලෙස ඇතුළත් කර ගනු ලැබීම සඳහා නොතාරිස්වරුන් පිළිබඳ අවසාන විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් පත්‍රයක් රෙජිස්ට්‍රාර් ජනරාල්තුමා වෙත ඉදිරිපත් කරන බව නොතාරිස් ආඥාපනතේ (107 අධිකාරය) I උපලේඛනයේ (7 වගන්තිය) "ආ" කොටසේ 2 වෙනි ව්‍යවස්ථාව අනුව මෙයින් දැනුම් දෙමි.

සුගතදාස වික්‍රමසිංහ වීරක්කොඩි අප්පුහාමි.

පරාක්‍රම සමුද්‍රය, 1973.2.3.

2–910—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත් කරගන්නා ලෙස කරන ලද ඉල්ලීමයි**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹදෙණි හත්පත්තුවේ උඩපොල මැදලස්සේ කෝරළේ බැව්ල්ගමුවේ පදිංචි සමරකෝන් මුදියන්සෙලාගේ උක්කු බණ්ඩා සමරකෝන් වන මම, මෙදින සිට පුරා මාසයක් ගතවූ පසු කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත් කර ගන්නා මෙන් වර්ෂ 1907 තේ අංක 1 දරණ නොතාරිස් ආඥාපනතේ 7 වෙනි වගන්තියේ දක්වන නියෝගය පරිදි නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස අවසර දෙන ලෙස ගරු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දන්වමි.

යූ. බී. සමරකෝන්.

බැව්ල්ගමුව, පොතුහැර,
1973. 2. 9.

2–852—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙරාතුව කෙරෙන නීත්‍යානුගත දැන්වීමයි**

මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර නගරයේ පද්ම වීදියේ අංක 33 දරණ ස්ථානයේ පදිංචි ගිගිරින්නේ බෝදිනායක ඇල්බර්ට් ජයවර්ධන වන මම, මෙදින සිට පුරා මසක් ගතවූ පසු මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළ්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වෙනි වගන්තිය යටතේ එම පනතේ I වෙනි උපලේඛනයේ "ආ" කොටසේ 2 වෙනි ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙයින් මහජනයාට හා ශ්‍රී ලංකා ජනරජයට දැනුම් දෙමි.

ජී. බී. ඒ. ජයවර්ධන.

1973.1.31.

2–919—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙර කරණ නීත්‍යානුකූල දැන්වීමයි**

ගාලු දිස්ත්‍රික්කයේ ඇල්පිටියේ පදිංචි ජෙන් වැලන් කරුණාරත්න වන මම, අද දින සිට පුරා මසක් ගතවූ පසු ගාළු දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රිජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 වෙනි අධිකරයේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ජී. වී. කරුණාරත්න.

1973 පෙබරවාරි 14.

2–908—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරන නීතියානුකූල දැන්වීමයි**

මහනුවර අධිකරණ දිස්ත්‍රික්කයේ උඩ හේවාහැටේ ඇහැලමල්පේ පදිංචි ඇල්ෆ්‍රඩ් පෙරේරා කරුණාතිලක වන මම, මෙදින සිට පුරා එක් මසක් ගතවූ පසු මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර ඉල්ලා රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාවෙත ඉල්ලීමක් කරන බව වර්ෂ 1907 අංක 1 දරණ නොතාරිස් ආඥාපනතේ I වෙනි උපලේඛනයේ "අ" ඡේදයේ ප්‍රකාර මවිසින් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනයාටත් දැනුම් දෙමි.

ඒ. පී. කරුණාතිලක.

ඇහැලමල්පේ,
කරඳගොල්ල,
1973.2.14.

2–927—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

ගාලු දිසාවේ ඇල්පිටියේ පදිංචි සාදිරිස් ලියනගමගේ වන මම, නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තියේ පරිදි මෙවක් සිට පුරා මසක් ගතවූ පසු ගාලු දිසාවේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු වශයෙන් ඇතුළත් කර ගැනීම සඳහාත් නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහාත් රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දැනුම් දෙමි.

එස්. ලියනගමගේ.

2–866—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

ඇතුල්ගම තලාතුඔය මහනුවර පදිංචි දොඩම්පේ රූපසිංහ මුදියන්සේලාගේ හෙන්ඩ්‍රික් රූපසිංහ වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළ්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 වන ඒ උප උපලේඛනයේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඩී. ආර්. ඇම්. එච්. රූපසිංහ.

ඇතුල්ගම,
තලාතුඔය,
මහනුවර,
6. 2. 73.

2–861—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

දඹදෙණි හත්පත්තුවේ උඩපොලම්බතොට කෝරළේ වැල්ලෑවේ පදිංචි වීරසේකර මුදියන්සේලාගේ ඩිංගිරි බණ්ඩා වන මම, මෙදින සිට පුරා මාසයක් ගතවූ පසු කුරුණෑගල දිස්ත්‍රික්කුවේ සිංහල භාෂාවෙන් කටයුතු කරණ ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු වශයෙන් ඇතුළත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 අධිකාරයේ 7 වෙනි වගන්තියේ "ආ" උපලේඛනයෙහි ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඩබ්ලිව්. ඇම්. ඩිංගිරි බණ්ඩා.

වැල්ලෑව,
8.2.73.

2–862—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

### දැන්වීමයි

කොටවැල්ලේ වැලිගමුවේ පදිංචි තිතස් බෙන්ජමින් මාරසිංහ වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් (සිංහල) කෙනෙකු ලෙස පත් කරනු ලැබීම පිණිස අද පටන් මාසයක් ගිය තැන රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලුම් කරන බව නොතාරිස් අඥපනතේ 107 වැනි අධිකාරයේ 7 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

ටී. බී. මාරසිංහ.

වැලිගමුව,
කොටවැල්ල.

2-863—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැලඩවිල්ලි හත්පත්තුවේ මහගල්බඩ මෙගොඩ කෝරළේ රංගම පදිංචි වීරසේකර මුදියන්සෙලාගේ කිරිබණ්ඩා වීරසේකර වන මම, සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු ලෙස කටයුතු කිරීම පිණිස ඇතුළත් කරගන්නා ලෙස නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීම සඳහා ගරු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් අඥපනතේ 107 වැනි පරිච්ඡේදයේ 7 වැනි වගන්තියේ පළමු වැනි උපලේඛණයේ "ආ" කොටසේ දෙවැනි නියෝගය පරිදි සියලු දෙනා වෙත මෙයින් ගෞරවයෙන් දන්වා සිටිමි.

ඩබ්ලිව්. ඇම්. කේ. බී. වීරසේකර.

රංගම, වැල්ලව,
1973 පෙබරවාරි මස 8.

2-858—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### සිංහල නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීමට අවසර ඉල්ලීමට පෙර කරනු ලබන දැන්වීමයි

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ කෝරළේ ගුන්නැපාන පදිංචි හේනේගෙදරවත්තේ වික්ටර් විජේකෝන් (හෙවත්, හේනේගෙදරවත්තේ වික්ටර් දුවුංබසේකර විජේකෝන්) වන මම, මෙදින සිට පුරා මසක් ගතවූ පසු මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන නොතාරිස්කෙනෙකු වශයෙන් ඇතුළුවීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් අඥපනතේ 107 වන අධිකාරයේ 7 වෙනි වගන්තිය අනුව පළමුවන උපලේඛනයේ "ආ" කොටසේ දෙවන ව්‍යවස්ථාවේ ප්‍රකාර රජයටත් මහජනයාටත් මෙයින් දැනුම් දෙමි.

එච්. වී. විජේකෝන්.

ගුන්නැපාන, පොල්ගොල්ල,
1973.02.10.

2-870—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අඥපනතේ 7 වෙනි වගන්තිය යටතේ කෙරෙන දැන්වීම

පාදුක්කේ මාදෙළුවාවේ පදිංචි දෙන් නෝරිස් මද්දුමගේ වන මම, අද සිට පුරා මසක් ගත වූ පසු කොළඹ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන මෙන් රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

ඩී. එන්. මද්දුමගේ,

1973 පෙබරවාරි 08 දින.

2-865—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර පරණගම පදිංචි කෝදුගොඩ හිටිගේ සැමී වික්‍රමරත්න වන මම, මෙදින සිට පුරා මාසයක් ගතවූ පසු මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු වශයෙන් ඇතුළත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් අඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

කේ. එච්. එස්. වික්‍රමරත්න.

07.02.73.

2-859—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

කිරිමැටියාව ගලහිටියාවේ පදිංචි වර්නකුලසූරිය ඇන්ටනී විල්ප්‍රඩ් වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස මට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් අඥපනතේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඩබ්ලිව්. ඇන්ටනී විල්ප්‍රඩ්.

2-849—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙර කරන නීත්‍යානුකූල දැන්වීමයි

හලාවත දිස්ත්‍රික්කයේ හලාවත නගරය තුළ පුස්තකාල පාරේ අංක 7 හි සිටි දැනට සිංහපුර පාරේ "නිෂාන්" හි පදිංචි ඇන්තනි ඉග්නේෂියස් එවුසේබියස් කෝස්තා වන මම, අද දින සිට පුරා මසක් ගතවූ පසු ප්‍රසිද්ධ නොතාරිස්කෙනෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන මෙන් කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව 1907 නොතාරිස් අඥපනතේ 7 වන වගන්තිය ප්‍රකාර මෙයින් දන්වමි.

ඒ. ඉග්නේෂියස් ඊ. කෝස්තා.

"නිෂාන්", සිංහපුර පාර,
හලාවත,
1973.01.31.

2-853—73.02.23 දින අංක 48 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

දැ. යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ජනවාරි ... | 73. 1. 5 | සිකුරාදා ... | 72.12.27 | බදාදා | දවල් 12.00 |
| | 73. 1.12 | සිකුරාදා ... | 73. 1. 3 | බදාදා | දවල් 12.00 |
| | 73. 1.19 | සිකුරාදා ... | 73. 1.10 | බදාදා | දවල් 12.00 |
| | 73. 1.26 | සිකුරාදා ... | 73. 1.17 | බදාදා | දවල් 12.00 |
| පෙබරවාරි ... | 73. 2. 2 | සිකුරාදා ... | 73. 1.24 | බදාදා | දවල් 12.00 |
| | 73. 2. 9 | සිකුරාදා ... | 73. 1.31 | බදාදා | දවල් 12.00 |
| | 73. 2.15 | බ්‍රහස්පතින්දා ... | 73. 2. 7 | බදාදා | දවල් 12.00 |
| | 73. 2.23 | සිකුරාදා | 73. 2.14 | බදාදා | දවල් 12.00 |
| මාර්තු ... | 73. 3. 2 | සිකුරාදා ... | 73. 2.21 | බදාදා | දවල් 12.00 |
| | 73. 3. 9 | සිකුරාදා ... | 73. 2.28 | බදාදා | දවල් 12.00 |
| | 73. 3.16 | සිකුරාදා ... | 73. 3. 7 | බදාදා | දවල් 12.00 |
| | 73. 3.23 | සිකුරාදා ... | 73. 3.14 | බදාදා | දවල් 12.00 |
| | 73. 3.30 | සිකුරාදා ... | 73. 3.21 | බදාදා | දවල් 12.00 |
| අප්‍රේල් ... | 73. 4. 4 | සිකුරාදා ... | 73. 3.28 | බදාදා | දවල් 12.00 |
| | 73. 4.11 | බදාදා ... | 73. 4. 4 | බදාදා | දවල් 12.00 |
| | 73. 4.19 | බ්‍රහස්පතින්දා ... | 73. 4.11 | බදාදා | දවල් 12.00 |
| | 73. 4.27 | සිකුරාදා ... | 73. 4.18 | බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.